# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject : Business Studies** **Grade 12** **Medium: Sinhala**

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**01)**

(i) (අ) ව්‍යාපාර හා වෙළෙඳපොල යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) "නිෂ්පාදිත භාණ්ඩ හා සේවා ලෙස වර්ග කෙරේ." භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 2ක් බැගින් ලැයිස්තුගත කරන්න.

(ල. 4)

(ii) (අ) ව්‍යාපාරයක ගති ලක්ෂණ හා අරමුණු 2 ක් බැගින් සඳහන් කරන්න.

(ආ) වෙළඳාම හා වාණිජ්‍ය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල. 4)

(iii) (අ) "විද්‍යුත් වාණිජ්‍ය කරා වර්තමානය පියමං කරයි" විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු 2ක් දක්වන්න.

(ආ) වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඔබ දකින ප්‍රවනතා 2 ක් නම් කරන්න.

(ල. 4)

(iv) "කළමනාකරුවෝ සහ තරඟකරුවෝ ඇල්මැති පාර්ශවයෝ වෙති". ඔවුන් කෙටියෙන් හඳුන්වා, ඔවුන්ගේ අරමුණු හා දායකත්වය සඳහා නිදසුන් 2 බැගින් ලියන්න. (ල. 4)

(v) "ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ව්‍යාපාරයට බලපෑම් එල්ල වන ආර්ථික හා දේශපාලන පරිසර සාධක ප්‍රමුඛතාවයක් ගනී." පොලී අනුපාත, භාණ්ඩ හා සේවා මිල මට්ටම් වෙනස්වීම හා නව යන්ත්‍ර සූත්‍ර භාවිතය නිෂ්පාදන ක්‍රම භාවිතය යන විචල්‍යන් ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම වෙන වෙනම පැහැදිලි කරන්න. (වගුවක් ලෙස ඉදිරිපත් කරන්න.)

(ල. 4)

(මුළු ල. 20)

**02)**

(i) (අ) තිරසර සංවර්ධනය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 2ක් නම් කරන්න.

(ල. 4)

(ii) (අ) තිරසර බව සඳහා වූ 4R සංකල්පය නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් නම් කරන්න.

(ල. 4)

(iii) රජය යටිතල පහසුකම් සපයන්නෙකු හා තරඟකරුවෙකු ලෙස ව්‍යාපාර වලට මැදිහත් වන ආකාර සඳහා නිදසුන් 2 බැගින් සඳහන් කරන්න. (ල. 4)

(iv) (අ) රජයක ආර්ථික අරමුණු 4ක් නම් කරන්න.

(ආ) ආදායම් බදු හා එකතු කළ අගය මත බදු පිළිබඳ කෙටියෙන් සඳහන් කරන්න.

(ල. 4)

(v) (අ) පාරිභෝගික ආරක්ෂණය අතීතයට වඩා වර්තමානයේ වැදගත් වීමට හේතු 2 දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) පාරිභෝගික වගකීම් 4ක් නම් කරන්න.

(ල. 4)

(මුළු ල. 20)

**03)**

(i) (අ) මොහොමඩ් මහතා ''මින්හාජ් කේටරින් සර්විසස්'' නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ නම් ඒ සඳහා අදාල නීතිමය පනත කුමක්ද?

(ආ) ඔබ උසස් පෙළ හදාරන ශිෂ්‍යයෙකු ලෙස සමූපකාර ව්‍යාපාර ජනතාව අතර ප්‍රචලිත කිරීමට ඔබ විසින් කළ යුතු යෝජනා 4 ක් සඳහන් කරන්න. (ල. 4)

(ii) (අ) ''පොදු අංශය පොදු ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ය''. රාජ්‍ය අංශය ව්‍යාපාර කටයුතු සඳහා මැදිහත් වන්නේ ඇයි දැයි කරුණු 4ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ) වරලත් ගිවිසුම අනුව වරලත් හිමියා විසින් වරලත් ලාභියාට සපයන පහසුකම් 4ක් සඳහන් කරන්න. (ල. 2)

(iii) (අ) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් 2ක් ලැයිස්තුගත කරන්න. (ල. 2)

(ආ) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 2ක් හා කුසලතා 2 බැගින් නම් කර කෙටියෙන් පහදන්න. (ල. 2)

(iv) ''රටක ආර්ථික සංවර්ධනයට ව්‍යවසායකත්වය දායක වෙයි''. මෙම අදහස උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ල. 4)

(v) (අ) ''සෑම සංවිධානයකටම පොදු වූ ලක්ෂණ කිහිපයක් දක්නට ලැබේ''. විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 2)

(ආ) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට වඩා කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීම වඩාත් යෝග්‍ය යැයි පුද්ගලයෙකු අදහස් කරයි. මෙම අදහසට එකඟ වීම සඳහා හේතු 2ක් දක්වන්න. (ල. 2)

(මුළු ල. 20)

**04)**

(i) (අ) හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුලත් විය යුතු කරුණු හතරක් දක්වන්න. (ල. 2)

(ආ) සංස්ථාපිත සමාගම් වල සුවිශේෂී ලක්ෂණ 2 ක් නම් කරන්න. (ල. 2)

(ii) (අ) සීමිත පොදු සමාගමක් හා සැසඳීමේදී සීමිත පෞද්ගලික සමාගමක ඇති වාසි 2ක් හා අවාසි 2ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ) ''සීමිත වගකීම'' හා ''නෛතික පුද්ගලභාවය'' යන සංකල්ප පැහැදිලි කරන්න. (ල. 2)

(iii) (අ) මුදල් යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ආ) ශ්‍රී ලංකාවේ භාවිතා වන මුදල් වලංගු මුදල් ලෙස පිළිගන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල. 2)

(iv) ආදිල් අසීස් ඔහුට අයිති කුරුණෑගල ඉඩම රු. මිලියන 4 ට රිෆ්ලාන්ට අලෙවි කළේය. රිෆ්ලාන් රු. මිලියන 3ක් ආදිල්ගේ බැංකුවේ තැන්පත් කළ අතර ඉතිරි රු. මිලියනය NSB බැංකුවෙන් ණයක් ගෙන ඉදිරි මාස දෙක තුළ ගෙවීමට පොරොන්දු විය.

(අ) මෙහි සඳහන් මුදලේ කාර්යයන් හඳුන්වා ඊට අදාල නිදසුන් ඡේදය තුලින් ඉදිරිපත් කරන්න. (ල. 2)

(ආ) මුදලේ කාර්යයන්හි වැදගත්කම නිදසුන් සහිතව සඳහන් කරන්න. (ල. 2)

(v) (අ) විද්‍යුත් මුදල් යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි උදාහරණ 2ක් දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ආ) විද්‍යුත් මුදල් / කාඩ්පත් මඟින් ගෙවීම් කිරීම සඳහා යොදා ඇති පහසුකම් 2ක් සඳහන් කරන්න. (ල. 2)

(මුළු ල. 20)

03)

(i) (අ) ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව ක්‍රියාත්මක කරන නූතන තාක්ෂණික ක්‍රියාමාර්ග 4ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ) ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජිත කාර්යයන් 4ක් නම් කරන්න. (ල. 2)

(ii) (අ) වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන තැන්පතු වර්ග අතුරෙන් ජංගම ගිණුම් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට ලබා ගත හැකි පහසුකම් 4ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ) ජංගම ගිණුමත් හා ඉතිරි කිරීමේ ගිණුමත් අතර පවතින සමානකම් එකක් හා අසමානකම් එකක් සඳහන් කරන්න. (ල. 2)

(iii) (අ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් යනු කුමක් දැයි හඳුන්වා ඊට නිදසුන් 2ක් ඉදිරිපත් කරන්න. (ල. 2)

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වයට දක්වන දායකත්වය කරුණු 4ක් මගින් සඳහන් කරන්න. .(ල. 2)